නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම - 2018
-----------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

නාගරික ආයෝජන හා සංවර්ධන සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
-----------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පිරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි,පොත්පත්,වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මුල්‍ය ප්‍රකාශන

**1.5.1** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂය | මුල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපි වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ජාතිය ගොඩනැගිමේ බද්ද | **648,257,352** | **648,767,630** | **510,278** | ඉදිරියේදී නිවැරදි වටිනාකම් ගිණුම්වල දැක්වීමට කටයුතු කරනු ඇත. | කඩිනමින්ම නිවැරදි වටිනාකම් ගිණුම්වල ගැලපිය යුතුය. |
| භාණ්ඩ හා සේවා බද්ද | **648,257,352** | **645,093,252** | **3,164,100** | | |

**1.5.2** ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රවණාගාරය වෙන්කිරීම් වියදම් හා පරිපාලන ගාස්තු රු. **255,256** ක් වු මුදල සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර නොතිබුණි. | **2019** වර්ෂයේදී නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | ගිණුම්ගත කල යුතු මුදල ගිණුම්වල ගැලපිය යුතුය |

**1.5.3** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයු විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | **32,044,737** | ස්ථාවර වත්කම් ලේඛනය | ස්ථාවර වත්කම් ලේඛනය සැකසීමට කටයුතු කර ඇත. | ස්ථාවර වත්කම් ලේඛන සකස් කර යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| කාලීන තැන්පතු | **750,000** | ශේෂ තහවුරු කිරිමේ ලිපි | ඉදිරියේදී ඉදිරිපත් කරනු ඇත. | කාලීන තැන්පතු සහතිකවල ශේෂ සනාථ කිරිම් කඩිනමින් ඉදිරිපත් කල යුතු වේ. |
| වෙළඳ ණයගැතියෝ | **39,977,316** | සෘජු තහවුරු කිරිම් | ඉදිරියේදී ඉදිරිපත් කරනු ඇත. | වෙළඳ ණය ගැතියන්ගේ සෘජු සනාථ කිරිම් විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කල යුතු වේ. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 03 ට වැඩි කාලයක් හිඟ ලැබිය යුතු ශේෂ පහත පරිදි විය.<br>• ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු රු. 2,698,338<br>• වැටුප් අත්තිකාරම් රු. 15,000 | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ශේෂ පිළිබඳ විධිමත්ව පරීක්ෂා කර අයකර ගත හැකි ශේෂ අයකර ගැනීමටත් , අනෙක් ඒවා ගිණුම්වල ගැලපීමට කටයුතු කල යුතු වේ. |

#### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 03 ට වඩා පැරණි ගෙවිය යුතු මුදල් පහත පරිදි විය.<br>• කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් රු. 626,050 කි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | අවශ්‍ය අඩු කිරීම් හා ගෙවීම් නිර්දේශ ලබාගෙන කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට කටයුතු කල යුතු බව |

### 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගණුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ ගිණුම අනුව නාගරික සංවර්ධන අධිකාරියේ ජංගම ගිණුමේ ශේෂය රු.218,401,530 ක් වුවද නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමට අදාල ජංගම ගිණුමේ ශේෂය රු.217,312,856 ක් වුයෙන් රු. 1,088,674 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | ජංගම ගිණුම් අතර නොසැසදීම් ඉවත් කිරීමට කටයුතු කල යුතු බව |

### 1.8 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 7.4.5 වගන්තිය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂන කමිටුවක් පත්කර භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | අදාල චක්‍රලේඛයට අනුකූලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 256.9 ක බදුපෙර ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 206.7 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 50.2 ක වර්ධනයක්

නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේදී ආයතන පරිපාලන වියදම් රු.මිලියන **8.8** ක් අඩුවීම හා ශුද්ධ මූල්‍ය වියදම රු.මිලියන **41.7** ක් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ප්‍රධාන ආදායම් | 2018/12/31 වටිනාකම | 2017/12/31 වටිනාකම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (%) |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 196,480 | 2,404,849 | 2,208,369 | 92 |
| උපදේශක සේවා හා කළමනාකරණ ආදායම | 4,549,511 | 7,081,965 | 2,532,454 | 36 |

| ප්‍රධාන වියදම් | 2018/12/31 වටිනාකම | 2017/12/31 වටිනාකම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (%) |
| ගොඩනැගිලි අළුත්වැඩියා හා පවත්වාගෙනයාමේ පිරිවැය | 2,629,135 | 1,240,326 | 1,388,809 | 112 |
| සනීපාරක්ෂක වියදම් | 1,405,800 | 627,000 | 778,800 | 124 |
| වෛද්‍ය වියදම් | 318,102 | 955,300 | 637,198 | 67 |

**නිරීක්ෂණ**

(i) **2017** වර්ෂයට සාපේක්ෂව **2018** වර්ෂයේදී වෙනත් මෙහෙයුම් ආදායම් හා උපදේශකත්ව හා කළමනාකරණ සේවා ආදායම් පිළිවෙලින් සියයට **92** හා සියයට **36** ක ප්‍රතිශතයකින් වර්ධනය වී තිබුණි.

(ii) **2017** වර්ෂයට සාපේක්ෂව **2018** වර්ෂයේදී වියදම් සංරචක **3** ක සියයට **50** ඉක්මවා මුළු වියදම වැඩිවී තිබුණි.

(iii) ගොඩනැගිලි අළුත්වැඩියා හා පවත්වාගෙනයාමේ පිරිවැය , සනීපාරක්ෂක වියදම් හා වෛද්‍ය වියදම් පිළිවෙලින් සියයට **67 – 124** දක්වා වූ පරාසයකින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ සමාගමේ ජංගම අනුපාතය **4.21:1** වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය **7.53:1** දක්වා වර්ධනයවී පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු නිකුත් කරන ලද අංක පීඊඩී/12 හා **2003** ජූනි **02** දිනැති පාලන චක්‍රලේඛය **7.3** වගන්තිය අනුව රාජ්‍ය ව්‍යාපාර , රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | අදහස් දක්වා නැත | චක්‍රලේඛයට අනුගත විය යුතු බවට නිර්දේශ කෙරේ. |

උපදෙස් ඒ ආකාරයට පිලිපැදිය යුතු වන අතර අනෙකුත් ක්‍රියාපරිපාටි හා විධිවිධාන ආයතනයේ අවශ්‍යතාවලට අනුරූපිව සකස් කරයි නම් ඒ වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද සමාගම විසින් පිළියෙල කරන ලද ක්‍රියාපරිපාටි හා විධිවිධාන සම්බන්ධයෙන් එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3.2** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | නාගරික සංවර්ධන අධිකාරියට බඳවාගත් නිලධාරින් හා සේවකයින් 08 දෙනෙකු ද්විතිය පදනම මත නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගමට අනුයුක්ත කර තිබුණි. මේ අනුව නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍ය කාර්ය මණ්ඩලය විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් බඳවාගැනීම වෙනුවට, නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම තුලින් බඳවාගැනීමේ ක්‍රමවේදයක් දිගින් දිගටම අනුගමනය කර තිබුණි. | අදහස් දක්වා නැත. | සමාගමට අවශ්‍ය කාර්යමණ්ඩලය පිළිබඳව අනුමැතිය ලබාගෙන එකී සේවක සංඛ්‍යාව පමණක් සේවයේ යෙදවිය යුතු අතර නාගරික සංවර්ධන අධිකාරිය සඳහා අවශ්‍ය සේවකයන් බඳවා නොගත යුතුය. |
| (ii) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.2 (ඩී) වගන්තිය සමාගම සඳහා සංවිධාන සටහනක් සහ අනුමත කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | සමාගම සඳහා අවශ්‍ය කාර්යමණ්ඩලය සඳහා අනුමැතියක් ලබාගැනීමට කටයුතු කල යුතුය. |

**3.3** වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු.17,965,769 ක්වූ ලෑන්ඩ්ක්‍රෑසර් වර්ගයේ වාහනය මිලදීගත් 2014 වර්ෂයේ සිට මේ දක්වාම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ පරිහරණය සඳහා ලබාදී තිබුණි. | අදහස් දැක්වීම සිදුකර නොතිබුණි. | අදාල වාහනය නාගරික සංවර්ධන අධිකාරිය පරිහරණය කරයි නම් එකී වාහනයේ නඩත්තු වියදම් පමණක් නොව මාසික සාධාරණ කුලී මුදලක් නාගරික සංවර්ධන අධිකාරියෙන් සමාගමට ලබාගැනීමට කටයුතු කල යුතුය.. |

**4.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**4.1** වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්‍ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ මූලික අරමුණ ලෙස ඕනෑම ප්‍රදේශයක ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම, ගොඩනැංවීම සහ ක්‍රියාත්මක කිරීම වේ. එසේ වුවත් ලඟාකර ගැනීමට අපේක්ෂිත භෞතික හා මූල්‍ය ඉලක්කයන් දැක්වෙන උපායශීලී ව්‍යාපාරික සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. එසේම සමාගමේ ප්‍රමුඛ කාර්යයන් වෙනුවෙන් ප්‍රධාන කාර්යසාධන දර්ශක කළමනාකරණය විසින් පිළියෙල කර නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ සමාගමේ කාර්යසාධනය විගණනයේදී නිශ්චය කල නොහැකි විය. | ඉදිරියේදී පිළියෙල කිරිමට කටයුතු කරනු ඇත. | සමාගම සම්බන්ධව දිගුකාලින උපායශීලි ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර වසරින් වසර ඒම සැලැස්ම යාවත්කාලීන කල යුතුය. |

**4.2** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්‍ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා නිකුත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකර නොමැත. | නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයක් හෝ විගණනයක් කල යුතු බව |

**4.3** විගණන කමිටුව

| විගණන නිරීක්‍ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ විගණන කමිටු පවත්වා නොතිබුණි. | විගණන කමිටු පවත්වා නොතිබුණි. | විගණන කමිටු පැවැත්විය යුතුය. |

**4.4** අයවැය පාලනය

| විගණන නිරීක්‍ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති සහ අංක PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5:2:4 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය වර්ෂයට මාස 03 කට පෙර අනුමත කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වු අයවැය ලේඛණය අනුමත කිරිමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |